ඔබ දුන් ලියවිල්ල කියෙව්වා. එය ඉස්ලාමය ආශ්‍රිත ව පැනනගින විවේචන නිරවුල් කරගන්න ඕනෑකමක් තියෙන කෙනකුට ඉතාමත් පිටිවහලක් වෙන එකක්.  අන්‍යාගම් ගැන ඇති අමූලික චෝදනා බැහැර කර අන්තර්ආගමික අවබෝධය, සහජීවනය වැඩිදියුණු කරගන්නට ඉන් ලැබෙන එළිය කියා නිමකරන්නට බැහැ. ඇත්තෙන් ම එවැනි ලියවිල්ලක් සිංහලෙන් නොතිබීම අඩුපාඩුවක්. මේ ලියවිල්ල සිංහලෙන් පළකරන්නට/බෙදාහරින්නට පියවර ගන්නව නාම් එය ආගමික සහජීවනයට බොහෝසෙයින් වැඩදායක වේවි. නමුත් මට තිබුණු මූලික ම ගැටලු කීපයකට පිළිතුරු එහි තිබුණේ නැහැ. ඒ ගැටලු ඉස්ලාමයට විරුද්ධව නැගෙන ප්‍රචලිත සහ ප්‍රබල තර්ක කීපයක් නිසා ඒවාට පිළිතුරු ඇතුළත් නොවීම අඩුවක්.  ඒ ගැටලු තමයි

1. ලිංගික වහල් සේවය
2. සමස්ත ඉස්ලාමීය නීතිය නොදෙන රජයකට එරෙහිව යුද්ධ කිරීම හෝ ඉස්ලාමීය රාජ්‍යයක් වෙනුවෙන් ලෝක යුද්ධ ඇතිවීම වැළැක්විය හැකි ද?
3. ඉස්ලාම් නීතියේ ඇති සමහර ප්‍රබල මානව හිමිකම් උල්ලංඝන

මේවාටත් පිළිතුරු ඇතුළත් කර එය වැඩිදියුණු කළ හැකි නම් එහි ප්‍රයෝජනවත්බව තවත් වැඩිවේවි. මේ ලිපියේ ඒ ගැටලු තැන් තුන වගේම එහි සදොස් කරුණු දෙකකුත් පෙන්වා දෙනවා.

## ලිංගික වහල් සේවය

මට තිවුණ ප්‍රධාන ම ගැටලුවක් නැත්නම් චෝදනාවක් තමයි ඉස්ලාමය යුධසිරකාරියන්/වහල් කාන්තාවන් දූෂණයට ඉඩ හරිනවාය යන්න. ඔබ දුන් ලිපියේ මගේ එම ගැටලුවට පිළිතුරක් තිබුණේ නැහැ. මා ඒ නිගමනයට ඒමට හේතුවුණ දත්ත පහත දක්වා තියෙනවා. ඒ ගැන යම් පිළිතුරක් සොයාදිය හැකි නම් ස්තූතිවන්ත වෙනවා.

කුරානයේ 23: 6 වැකිය අනුව තමන්ගේ භාර්යාවන් සමග වගේම තමා යටතේ සිටින වහල් ස්ත්‍රීන්/යුධ සිරකාරියන් සමගත් කෙනකුට ලිංගිකව හැසිරීමට අවසර තිබෙනවා. කුරානයේ වෙනත් කිසිදු වැකියක හෝ කිසිම හදීසයක හෝ මෙම යුධසිරකාරියන්/වහල් කාන්තාවන් සමග ලිංගිකව හැසිරීමේ දී ඔවුන්ගේ කැමැත්ත තිබිය යුතු බවට නියමයක් නැහැ. ඒ නිසා ඉස්ලාමීය නීතිය තුළ වහල් කාන්තාවක් තම හිමිකරු වෙතින් දූෂණය වීම සිනා වරදක් ලෙස සලකන්නේ නැහැ. ඉස්ලාමයේ ස්ත්‍රීදූෂණය තිබෙන්නේ සිනා හෙවත් විවාහයෙන් බැහැර ලිංගික හැසිරීම්වල ම එක් ප්‍රභේදයක් ලෙසයි. සිනා වරදක් සිදුවන්නේ නිදහස් මුස්ලිම් ගැහැනු-පිරිමි සම්බන්ධයෙන් පමණයි.  වහලුන් (කාන්තාවන්ද ඇතුලුව) සැලකෙන්නේ දේපලක් විදියට. ඒ නිසා වහල් කාන්තාවන්ට විරුද්ධව සිදුවන දෙයකුත් දේපලකට අලාභයක් සිදුවීමට සමාන නෛතික තත්වයකුයි දරන්නේ. ඉතින් වෙන කෙනෙකුගෙන් දූෂණය වුණොත් ඇගේ හිමිකරුට අලාභය ගැන නඩු පවරන්න හැකිවුණත් ඇය දේපලක් නිසා හිමිකරුවාගෙන් දූෂණය වුණොත් ඔහුට එරෙහිව ඇයට නඩු පවරන්නට බැහැ. මොනම හේතුවක් නිසාවත් කෙනකුට බාරදුන් යුධසිරකාරියක් නැවත රජයට ලබාගන්නත් බැහැ.

ෂාෆි ඉ සහ මාලික් මද්හබ් දෙකට අනුව කිසියම් කාන්තාවක් ඇගේ සැමියාත් සමගම අල්ලාගෙන තිබුණත් ඔවුන් ලිංගික වහලියන් ලෙස යොදාගැනීමට බාධාවක් නැහැ. (හනෆි මද්හබයට අනුව සැමියා ජීවත් සිටින ස්ත්‍රියක් තනිව අල්ලාගෙන ඇත්නම් ඇයත් සමග එක්විය හැකියි. යුවලම සිටියොත් බැහැ) කුරානයේ 4: 24 වැකිය සමග මෙය අනුකූලයි. එය පහළ වූ අවස්ථාව සුනන් අබුදාවුද් 2150 හි දැක්වෙන්නේ මෙලෙස යි.

> අබු සායිද් අල් කුද්රි මෙසේ දැනුම් දෙයි. හුනායින් යුද්ධයේ දී නබිතුමන් විසින් අව්තාස් වෙත බලඇණියක් යවන ලදී. සිය සතුරු හමුදාවට මුහුණ දී ජයග්‍රහණය කළ ඔවුන් සටනින්  ඉතිරි ව සිටි අය ජීවග්‍රහයෙන් ගත්හ. ඔවුන් අතර සිටි කාන්තාවන් සමග ඔවුන්ගේ අන්‍යාගමික ස්වාමිපුරුෂයන් ද සිටි බැවින් ඇතැම් සහාබාවරු එම කාන්තාවන් සමග ලිංගිකව එක් නොවී සිටියහ. එබැවින් ප්‍රඥාවන්ත වූ අල්ලාහ් විසින් ඉද්දාව සම්පූර්ණ කළ පසු එවැනි ස්ත්‍රීන් ද තහනම් නොවන බව

පෙන්වාදෙනු පිණිස මෙම වැකිය පහළ කරන ලදී. එනම් සැමියන් සිටින කාන්තාවන්වද (ඔබට විවාහ කර ගැනීම තහනම්) කර ඇත්තේය. එහෙත් ප්‍රතික්ෂේප කරන්නන් සමග සිදු වූ යුද්ධයෙන් අත් අඩංගුවට ගනු ලැබ ඔබගේ යටතෙහි සිටින (වහල්) ස්ත්‍රීන් හැර.

වහල් ස්ත්‍රියකට උපදින දරුවන් විවාහයක දරුවන් හා සමානම අයිතිවාසිකම් ලබන බවත්, දරුවකු ලැබීමෙන් පසු ඇය වෙනත් වහලියක් මෙන් විකිණිය නොහැකි වන බවත් ඇත්ත. දරුවන් ලැබූ තැනැත්තියක් හිමිකරුගේ මරණින් පසු නිදහස් වන බවත් ඇත්ත. නමුත් මේ කාන්තාවන් දූෂණය කිරීම වළක්වන්නට හෝ එසේවුවහොත් පියවරක් ගන්නට කිසිම ප්‍රතිපාදනයක් ඉස්ලාමය තුළ නැහැ. එසේ ඔවුන්ගේ සුරක්ෂිතතාවට කිසිදු ආවරණයක් නැතිව ඔවුන් සමග ලිංගිකව හැසිරීමට අවසර දීම ගැටලුසහගතයි. ඇවැසි නම් ඔවුන්ව දූෂණය කරන්නත් ඉස්ලාමය ඉඩ හදා දී තියෙනවා. නිකමට හිතන්න තමන්ගේ සැමියා ඉන්න කාන්තාවක් සැමියා ඉද්දි සතුරු හමුදාවත් එක්ක කැමැත්තෙන් නිදිවදිනවද? ඉතින් ඉහතින් දැක්වූ හදීතය තුළ අල්ලා අනුබල දෙන්නේ ස්ත්‍රීදූෂණයකට නෙවේනම් වෙන කුමකට ද? (අල් අෂර් සරසවියේ මහාචාර්යවරියක් වන සුආද් සාලේ නම් නිදසුනක් ගනිමින් පැවසුවේ ඔවුන් ඊශ්‍රායලය ආක්‍රමණය කළොත් යුදෙව් කතුන් මුස්ලිම්වරු අතට පත්වන්නේ ඔවුන් ව ලැජ්ජාවට පත්කිරීම දෙවියන්ගේ අරමුණ නිසා බවයි!)

සයියද් අබුල් අලා මවුදූදි නම් නූතන යුගයේ සිටින ඉහළ පිළිගැනීමක් ඇති කුරාන අර්ථවිචාරකයෙක් පවසන්නේ මෙසේ වන්නේ එම කාන්තාවන් යුදබිමේ සිට ඉස්ලාම් නීතිය සහිත ප්‍රදේශයකට පැමිණෙන විට ඔවුන්ගේ පැවති විවාහ බන්ධනය බලරහිත වන නිසා බවයි!

බුහාරි 4350 හදීසයේ එක්තරා අවස්ථාවක නබිතුමා අලි ව යවනවා යුධසිරකාරියන් පිරිසක් රැගෙන එන්නට. ඔහු ඔවුන්ගෙන් කෙනෙක් සමග ලිංගිකව හැසිරීම නිසා ස්නානය කළ බව දුටු බුරයිදා නම් එම හදීසය දැනුම් දෙන්නා ඔහු ව පිළිකුල්කරනවා. මුණගැසුණු විට නබිතුමාට පවසනවා. එතකොට නබිතුමා විමසන්නේ ඔබ අලිව මේ ගැන පිළිකුල් කරනවාද කියලයි. බුරයිදා ඔව් කිව්වාම නබිතුමා නැවතත් අසන්නේ අලිට කුමුවරුන්ගෙන් මීටත් වඩා දේ ලැබිය යුතු ව තිබිය දී ඔබ ඔහු ව පිළිකුල් කරනවාද කියලයි.

ඒ වගේම 24: 33 හි බලනොකරන්නැයි පවසන්නේ අනාථයන් සමග මුදලට ලිංගිකව හැසිරීමට මිස හිමිකරුවා සමග නොවේ. (එය පහළ වූ අවස්ථාව බලන්න - මුස්ලිම් 43: 7180 සහ අබුදාවූද් 12: 2302) ඒ වගෙම 23:6 හි වහල් ස්ත්‍රීන් වෙනම සඳහන් කිරීමෙන් පෙනෙන්නේ ඔවුන් සමග එක්වීමට විවාහය ඇවැසි නොවන බවයි. මොකද විවාහය ඇවැසි නම් ඔවුන් ද භාර්යාවන්ට ඇතුළත් වන නිසා අමුතුවෙන් ඔවුන් සමග පුලුවන් කියන්න ඕන නැහැ. භාර්යාවන් සමග පුලුවන් කිව්වාම විවාහ කරගත් වහල් කාන්තාවන් සමගත් පුලුවන් බව කියැවෙන නිසා. නමුත් වෙන වනම දක්වා තිබීමෙන් පෙනෙන්නේ වහල් කාන්තාවන් සමග ලිංගිකව එක්වීමට විවාහයක් වුවමනා නැති බවයි.

(බලන්න - මවුදූදි සිය කුරාන් අර්ථවිවරණයේ අන් නිසා පරිච්ඡේදයට සපයන 44 වැනි අධෝසටහන.)

## ඉස්ලාමය පිළිගන්නා තුරු සටන් වැදීමට අණ ලබා ඇත.

මීළගට මා ඉදිරිපත් කළ එක් කරුණකට පමණක් පිළිතුරක් දක්නට ලැබුණා. (නමුත් ඒ ඉදිරිපත් කරුණේ පොඩි ගැටලුවක් තිබෙනවා.) ඒ නබිතුමන් සියලුදෙනා ඉස්ලාමය අදහන තුරු සටන් කිරීමට අණ ලැබී ඇති බව කියන හදීසයයි. ලිපියේ ඒ ගැන දක්වන අදහස වන්නේ පරිවර්තනය වැරදි බවත් එහි සඳහන් වන්නේ මැරීමට යන වචනය නොව සටන් කිරීමට යන වචනය බවයි. මේ අරාබි වචන දෙක එක ළඟින් යන විදියට ශබ්ද වෙනවා. අදහන තුරු සටන් කරනවා යන්නේ අරුත සහ පසුබිම් සිද්ධිය (මුස්ලිම්වරුන් සමග පක්ෂපාතව සිටි ගෝත්‍රයකට වෙනත් ගෝත්‍රයක් ප්‍රහාර එල්ල කිරීම) අනුව විමසන විට මෙය ආගම ඇදහීමට නිදහස් පරිසරයක් ඇතිකරගැනීමට කරන සටනක් විනා බලහත්කාරයෙන් ආගම ඇදහීමක් අදහස් නොකරන බවයි.

මේ තියෙන්නේ ඔබ දුන් ලිපියේ දක්වා කිබෙන හදීසයේ නිවැරදි පරිවර්තනය යි. මම එය එම ලිපියෙන්ම පිටපත් කළා.

The Messenger of Allah said: “I have been ordered to fight the people until they say: ‘La ilaha illallah’. So when they say that, their blood and their wealth are safe from me, except for a right, and their reckoning is for Allah’ (Tirmidhi 3341, Muslim 137)

දැන් බලමු මෙහි අර්ථය බලහත්කාරයෙන් ආගමට හරවා ගැනීමක් ද නැත්නම් ආගම ඇදහීමට නිදහස් පරිසරයක් ඇති කිරීමට කරන සටනක් ද කියලා.

මෙතන කියනවා මිනිස්සු ෂහාදා ව කියන තුරු සටන් කිරීමට අණ ලබා තියෙනවා කියා. ෂහාදාව කියනවා කියන්නේ ඉස්ලාමය වැළඳගන්නවා කියන එකයි. ආගම ඇදහීමට සුරක්ෂිත වටපිටාවක් ඇතිකරන්න අන් අය තම ආගම ම ඇදහිය යුතු ද? ආත්මාරක්ෂාවක් නම් කිව යුතු ව තිබුණේ ඉස්ලාමය ඇදහීමට සුරක්ෂිත පරිසරයක් ඇතිවනතුරු හෝ ඔවුන් ආයුධ බිමතබන තුරු සටන් කිරීමට අණ ලබා ඇත කියලයි. නමුත් අණ ලබා තියෙනවා කියන්නේ අන් අයත් ඉස්ලාමය වැළඳගන්නා තුරු සටන් කිරීමටයි.

මීළගට ආගම අදහන තුරු සටන් කරනවා කිව්වත් ආගම අදහන තුරු ඝාතනය කරනවා කිව්වත් ඇති වෙනසක් පේන්නේ නැහැ. හිතන්න මම ඔබ බුද්ධාගම වැළඳගන්නා තුරු ඔබ සමග සටන් කරනවා. ඒ කියන්නේ ඔබ බුද්ධාගමට එන තුරු ඔබ සමග යුද්ධ කරනවා. ඔබ බුද්ධාගම එන තුරු ඔබට අවියකින් හෝ අතින් පයින් හෝ පහර දෙනවා. මොකද මෙතන ජමියතුල් උලමා සංවිධානය නිවැරදි ලෙස පරිවර්තනය කර තියෙන්නෙත් fight කියන වචනය යොදමින්. මෙය සන්නද්ධ නොවන මතවාදී අරගලයක් පමණක් වුණා නම් යෙදිය යුතු ව තිබුණේ strive හෝ struggle වැනි වචනයක්. ෆයිට් කරනවා කියන්නේ ගහනවා කියන එකයි. පිළිගන්නකං ගහනවා. නොපිළිගත්තොත් මොකද වෙන්නේ ගුටිකාලම, කඩුපාරවල් කාලම, ලේ ගලලම මැරෙනවා. ඉතින් කලින් කිව්වා වගේ ආගම අදහන තුරු සටන් කිරීමෙන් එන්නෙ ආගම අදහන තුරු මරාදැමීමෙන් වෙනස් ප්‍රතිඵලයක්ද?

හරි. මේ ඔක්කොම පැත්තකින් තියමු. මේ නිවැරදි පරිවර්තනයේ ම තියෙනවා මෙහෙම කොටසක්. (ආයෙත් කොපි කළා ඔන්න)

So when they say that, their blood and their wealth are safe from me, except for a right, and their reckoning is for Allah’

ඒයාලා එහෙම කිව්වොත් තමයි එයාලගේ රුධිරය මගෙන් ආරක්ෂා වෙන්නේ කියලයි කියන්නේ. ෂහාදාව කිව්වොත් ලේ හලන්නෙ දඩුමක් කාරිය දෙනකොට විතරලු. නොකිව්වොත්? එතකොට රුධිරය මගෙන් ආරක්ෂා කරගන්න බැරිවෙනවා. ඒ කියන්නෙ ජීවිතය/රුධිරය අනාරක්ෂිත වෙනවා. නැතිවීමේ අයවදානමක් ඇතිවෙනවා.

ඇත්තටම මේ වගේ ගොබ්බ තර්කයක් ඉස්ලාමීය විද්වත් සංවිධානයකින් මම බලාපොරොත්තු වුණේ නැහැ. මොකද මීට කලින් මම මේ හදීසය ගැන ලෝකයේ ප්‍රසිද්ධ ඉස්ලාමීය විද්වතෙක් වන ආචාර්ය ෂිබ්රි අලි සමග කළ යූටියුබ් සංවාදයක් නරඹලා තියෙනවා. ඔහු නම් කිව්වෙ මේ හදීසය නබිතුමා කිව්වෙ එතුමාගේම සනුහරය වන කුරයිෂ්වරු ගැන කියලයි. ඔවුන් ඉතාම මුරණ්ඩු පිරිසක් වුණ නිසාත් ඒ ගතිය නබිතුමා හොඳින් ම දැනසිටිය නිසාත් ඔවුන්ට ඉස්ලාමයට පැමිණීම හැර වෙන විකල්පයක් නොදුන් බවයි. (මීට අමතරව ධර්මය පහළ කළ තෝරාගත් සමූහයට එය ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් නැති නිසා අරාබි අර්ධද්වීපයේ බලෙන් පතුරුවන්නට අණ කළ බවත් කියවෙන මතයක් තිනවා.)

මුස්ලිම්වරුන්ගේ ආගමික පැනවලට පිළිතුරු දෙන වෙබ් අඩවියකත් මේ හදීසය සම්බන්ධ ගැටලුවට මෙලෙසයි පිළිතුරු දීලා තිබුණේ.

examination of context and scholarly interpretation reveals that the hadith by no means refers to all people and is not calling for any sort of war, holy or unholy. The key to understanding the hadith, then, is to understand who exactly is meant by the word “people” in the statement, “I was ordered to fight people.”

This same hadith has various narrations as recorded by different hadith scholars. Imam Nasa’i’s narration reads: “I was ordered to fight the polytheists” rather than the word “people,” and it is an established principle in hadith methodology that various narrations of the same hadith serve to clarify its actual meaning. Hence, the narration of Imam Nasa’i indicates that the word “people” in the first narration does not refer to all people, but rather a specific group of people, namely, certain polytheists.

Imam Abu Hanifa and his legal school limited this hadith to only the polytheists among the Arabs. And Imam Malik and his legal school limited it to only the Quraysh tribe among them. [Ibn Battal, Sharh al-Bukhari]

Imam Kasani, the eminent 6th-century Hanafi jurist, explains that the reasoning of this position is based on the difference between Arab polytheists and all other peoples, including People of the Book [i.e., Jews and Christians, Arab or non-Arab] and non-Arab polytheists. With respect to peoples other than Arab polytheists, it is hoped that by mutual coexistence between them and Muslims, they will be drawn to Islam after reflecting over the beauty of the religion and its Sacred Law [shari’a]. [f: And that hope is sufficient; whether they become Muslim or not is irrelevant to the Hanafi and Maliki perspective that they are not addressed by the hadith.]

**The nature of Arab polytheists, however, was to reject anything that conflicted with their customs and traditions, deeming all else to be madness and worthy of scornful ridicule. They were a people –** as repeatedly mentioned in the Qur’an **– that refused to reflect over anything but “the ways of their forefathers.” Therefore, because the Messenger of Allah** [peace and blessings be upon him] **was from their same tribe and knew them intimately, he gave them no option but acceptance of Islam or fighting** [f: And this statement, of course, was after years of being oppressed by those Arab polytheists].

[Kasani, Bada’i al-Sana’i]

(බලන්න - Jihad, Abrogation in the Quran & the “Verse of the Sword”)

ෆරස් රබ්බානි විසින් අනමත කරපු උස්තාද් ෆරස් ඒ. ඛාන් සපයන මේ පිළිතුරෙන් වගේම ෂිබ්රි අලිගේ පිළිතුරත් කියන්නේ මේ හදීසය ආත්මාරක්ෂාවක් සම්බන්ධ බව නෙවේ. බලෙන් ආගමට ගත්තා. උන්ව හදන්න බැරි නිසා. හැබැයි ඒක අදට හෝ වෙනත් අයට අදාල නැහැ කියලයි. ඔවුන් කිසිවෙක් මෙය බලහත්කාරයෙන් ආගමට ගැනීමක් බව බැහැර කරන්නේ නැහැ. වගකිව යුතු බුද්ධිමත් පිරිසක් ලෙස ඉතාම බොළඳ තර්කයක් යෙදීමටත් වඩා ජමියතුල් උලමා සංවිධානය ලැජ්ජා විය යුත්තේ ඉස්ලාමීය නිති ගුරුකුල විසින් පවා පිළිගත් මතය බැහැර කර අනෙකක් කීම ගැනයි.

නමුත් මට ඔබෙන් හෝ වෙනත් අයගෙන් පැහැදිලි කරගත යුතු දෙයක් තියෙනවා. මෙතන සඳහන් වෙන්නේ හනෆි හා මාලික් මත ගැන විතරයි. ලිපිය මුලුමනින් ම කියවන විට පෙනෙනවා එහි ඔවුන් මේ මත දෙක පමණක් ගන්න උත්සාහ කරන බව. ඒ කියන්නේ ලංකාවේ වැඩි පිරිසක් සිටින ෂාෆි ඉ මද්හබය දරන අදහස තරමක් දරුණු එකක් ද කියන සැකය එනවා. ඒ පිළිබඳ මූලාශ්‍රයක්/දත්තයක් ලැබුණොත් පැවසිය හැකි නම් ඉතාමත් ස්තූතිවන්ත වෙනවා. 9: 5 වැකිය විසින් 2, 256 ඇතුලු සාම වාක්‍ය රැසක් අහෝසි වූ බව මධ්‍යකාලීන යුගයේ ඇතැම් විද්වතුන් පවසා තිබෙනවාලු. මොකද ලෙටර් වූ බග්දාදි ලිපියේ විද්වතුන් පවසනවා මෙහෙම:

> ජිහාඩයේ අරමුණ පීඩනයෙන් මිදීම බැවින් අන්‍යාගමිකයන්ට එරෙහි ව කරන ආක්‍රමණකාරී, ප්‍රචණ්ඩ ජිහාඩයක් නොමැත. මෙය (ෂාෆි ඉ ගුරුකුලයේ විද්වතුන් කිහිපදෙනෙකු හැරුණු විට) අබූ හනීෆා, මාලික් සහ අහ්මද් සහ ඉබ්න් තයිමියයාහ් වැනි විද්වතුන්ගේ ද මතයයි.

## සමස්ත ඉස්ලාමීය නීතිය නොදෙන රජයකට එරෙහිව යුද්ධ කිරීම හෝ ඉස්ලාමීය රාජ්‍යයක් වෙනුවෙන් ලෝක යුද්ධ ඇතිවීම වැළැක්විය හැකි ද?

මට තිබුණ තවත් ගැටලුවක් තමයි මේ. කුරානයේ 5: 48, 5: 50, 5: 49, 4, 53-54 වැනි වැකි අනුව මුස්ලිම්වරුන්ට ඉස්ලාම් නීතියෙන් කොටසක් පමණක් පිළිපැදීමට අයිතියක් නැති බව පෙනෙනවා. ඔවුන් සමස්ත පද්ධතියම අනුගමනය කළ යුතු යි. හොරකමට අත් කැපීම, ඝාතකයන් මැරීම, මේ ආදී සෞදියේ හැම නීතියක්ම පිළිපැදිය යුතු යි. එවිට මුස්ලිම්වරුන්ට සමස්ත ඉස්ලාම් නීතිය ඉල්ලා තමන්ගේ රටවල යුද්ධ කළ හැකි ද? මේ මත ඔවුන්ට සන්නද්ධ ව්‍යාපාර ඇරඹිය හැකි ද? පෙනෙන හැටියට මුස්ලිම්වරුන් අවනත විය යුතු ම වන්නේ ඉස්ලාමයට පමණයි. එවැනි සටනක් ඇරඹුවොත් වැළැක්විය හැකි ඉස්ලාමීය තර්කයක් (හදීසයක්/කුරාන වැකියක්) නැහැ මා දන්නා තරමින්. සයියද් ක්විත්බ් ද පවසා තියෙනවා ඉස්ලාමීය නොවන පද්ධති ඇසුරේ විසීම නිසා මුස්ලිම්වරුන්ගේ ජීවිත දූෂණය වෙලා තිබෙන බවත් මේ නිසා ලෝකය හැම රටක් ම ආක්‍රමණය කර ඉස්ලාමීය පාලනයක් ස්ථාපිත කළ බවත්. ඔහුගේ කියුමක් මෙහි තරමක් අග දක්වා තියෙනවා.

මට තිබෙන මෙහි පිළිතරු නොතිබුණ අනෙක් ගැටලුව තමයි- ලෝකයෙ සියලුම රටවල් තනි ඉස්ලාමීය පාලනයකින් පාලනය කිරීමට සටනක් ඇරඹීම වැළැක්විය හැකි ඉස්ලාමීය තර්කයක් තිබෙනවාද යන්න. මොකද අනාගතයේ දිනක නැවතත් ඉස්ලාමීය රාජ්‍යය ඇතිවන බව නබිතුමන් පවසා තිබෙනවා.

> The following *hadith* from Musnad Ahmad ibn Hanbal can be understood to prophesy two eras of Caliphate (both on the lines/precepts of prophethood).
>
> > Hadhrat Huzaifa narrated that the Messenger of Allah said: Prophethood will remain among you as long as Allah wills. Then Caliphate (Khilafah) on the lines of Prophethood shall commence, and remain as long as Allah wills. Then corrupt/erosive monarchy would take place, and it will remain as long as Allah wills. After that, despotic kingship would emerge, and it will remain as long as Allah wills. Then, the Caliphate (Khilafah) shall come once again based on the precept of Prophethood.[66][*page needed*]

අයි. එස් වැනි සංවිධානයකට බැඳීමට මෙහි බලපෑම අමුතුවෙන් කිවයුතු නැහැනේ. වැරදිලාවත් මුස්ලිම් වුණානං මේක දැක්කම මටත් හිතෙන්න තිවුණා යන්න. මුස්ලිම්වරු කිසිවෙක් අයි. එස්. සංවිධානය එහි කෲර බව සම්බන්ධයෙන් විනා අරමුණ සම්බන්ධයෙන් විවේචනය කරනවා මා දැක නැහැ. ඒ වගේම බග්දාදිතුමන්ට ලොව පුරා ඉස්ලාමීය විද්වතුන් 126 කගේ අත්සනින් ඔහුගේ ක්‍රියාකලාපයන්හි වරදි

පෙන්වමින් යවන ලිපියේවත්, අයි. එස්. සංවිධානය හෙළාදකිමින් සවුදියේ මුෆ්තිවරයා නිකුත් කර ඇති ෆත්වා නියෝගයේවත් ඉස්ලාමීය රාජ්‍යක් යළි බිහිකිරීම වැරදි බව පැවසෙන්නේ නැහැ. ඒ කියන්නේ ඒවැන්නක් වෙනුවෙන් සටන් වැදීම වැරදි නැහැ. සවුදි පූජකවරුන් බග්දාදිව විවේචනය කර තිබෙන්නේ ඔහු ප්‍රජාවගේ/ඉස්ලාමීය නායකයන්ගේ අනුමැතියකින් තොරව තමාව කාලිෆ්වරයෙක් ලෙස ප්‍රකාශකරගැනීම ගැනයි. කාලිෆ්වරයා තීරණය කිරීම මුස්ලිම් ජනතාව විසින් කළ යුතු බවයි බහුතර විද්වත් පිළිගැනීම. මට ගැටලුව නම් මේ කියන විදියට ඉස්ලාමීය රාජ්‍යක් පතා යුධ වැදීමේ ඉඩක් තිබෙනවා නම්, එයට අනුබල දෙන තැන් (ඉහත හදීසය) මිස වළක්වන තැන් නැත්නම් එය භයානක තත්වයක් නේද? ඔබ දැන් අහන්නට පුලුවන් එහි ඇති වරද, භයානක බව කුමක් ද කියා. නමුත් බග්දාදිට වඩා වෙනස් ලෙස නිවැරදිව, කුරිරු/සිවිල් ඝාතන නැතිව, ඉස්ලාමීය යුධ විනයානුකූලව එය කරන්නට ගියත් එය මහා ලෝක යුද්ධයක් වනවා නොවේ ද? එහි නිමාවක් වෙන එකක් නැහැ. ලෝක සාමය නැති වේවි. ජීවිත අහිමි වේවි, දෙපාර්ශ්වයන්ගේ ම. කිසිම රටක් තම බලය, ප්‍රතිපත්ති, නීති හැරදමන්නට කැමති වන්නේ නැහැ ඉස්ලාමය වෙනුවෙන්. අනික එය ජයගත්තත් ඒ තුළත් රටක ස්වෛරීත්වය, දේශපාලන නිදහස උල්ලංඝනය වෙනවා. තමන් කැමති ප්‍රතිපත්ති මත පොදු නිති යටතේ තම වැසියන් පාලනය කිරීමට රටක රජයකට තිබෙන අයිතිය නැතිවනවා.

ඒ විතරක් නොවෙයි. වත්මන් ඉස්ලාම් නීතියේ (fiqh) තිබෙන ගැටලු සහගත, මානව හිමිකම් කඩවන තැනුත් බොහොමයි. ඉස්ලාමීය රාජ්‍යයක් ඇතිවුණොත් මුලු ලොවම මේ අමන නීතිවලින් පීඩා විදීවි.

**මීළඟට එම ලිපියේ තිබෙන සාවද්‍ය කරුණු කිපයක්, එකඟ නොවිය හැකි තැන් කීපයකුත් දක්වන්නට අවසරයි.**

ඉස්ලාම් පාලනය තුළ මුස්ලිම්වරුන් නොවන අයට වන අවාසි

ජිස්යාව ගැන මේ ලිපියේ දක්වන කාරණා මමත් දන්නවා වගේ ම පිළිගන්නවා. නමුත් මෙවැනි දෙයකුත් තිබෙනවා.

As for *jizyah*, there are two types of *jizyah* in *Shari'ah* (Islamic Law). The first type is that which is levied while the subjects are '***readily being subdued***'. This applies to those who fought Islam, as is understood from God's ﷻ words: '***Fight those who do not believe in God, nor in the Last Day, and who do not forbid what God and His Messenger have forbidden, nor do they practise the religion of truth, from among of those who have been given the Scripture, until they pay the jizya tribute, readily being subdued.***' (*Al-Tawbah*, 9: 29). As is clarified by a preceding verse in this *Surah* (chapter of the Qur'an), those intended by this verse are parties who pre-emptively attacked Muslims: '***Will you not fight a people who broke their oaths and intended to expel the Messenger - initiating against you first? Are you afraid of them? God is more worthy of your fear if you are believers.***' (*Al-Tawbah*, 9:13)[41]. The second type of *jizyah* is levied on those who do not wage war against Islam; it is levied on them instead of *zakat* (which only Muslims pay and which is higher in percentage than the *jizyah*) through a covenant and without harshness. Omar ibn Al-Khattab agreed to call it 'charity' (*sadaqah*). The *jizyah* is then deposited to the state treasury and is distributed among citizens, including needy Christian citizens as Omar ﷺ did during his caliphate[42].

මේක උපුටා ගත්තේ අබූබකර් අල් බග්දාදිතුමන්ට එතුමන්ගේ හා සංවිධානයේ ක්‍රියාවන් ඉස්ලාමයට එකඟ නොවන බව පෙන්වමින් ලොව පුරා සුන්නි ඉස්ලාම් විද්වතුන් 127 කගේ අත්සනින් යැවූ ලිපියෙන්. එවැනි සාමාකාමී ලිපියකත් සඳහන් වීමෙන් පේන්නේ මේක අන්තවාදීන් වැරදි ලෙස නිර්මාණය කළ දෙයක් නොවන බවයි.

ඒ වගෙම තෆ්සීර් ඉබ්න් කාතිර් තුළත් මෙලෙස සඳහන් වෙනවා.

---

Allah encourages the believers to show enmity to the idolators and to dissociate from them, affirming that they do not deserve to enjoy a covenant of peace, because of their Shirk in Allah and disbelief in Allah's Messenger

(This matter (Islam) will keep spreading as far as the night and day reach, until Allah will not leave a house made of mud or hair, but will make this religion enter it, while bringing might to a mighty person (a Muslim) and humiliation to a disgraced person (who rejects Islam). Might with which Allah elevates Islam (and its people) and disgrace with which Allah humiliates disbelief (and its people).) **Tamim Ad-Dari ﴿who was a Christian before Islam﴾ used to say, "I have come to know the meaning of this Hadith in my own people. Those who became Muslims among them acquired goodness, honor and might. Disgrace, humiliation and Jizyah befell those who remained disbelievers."**

*Thafseer Ibn Kathir*

ඒ වගේම ඉස්ලාමීය පාලනයන් තුළ ඉස්ලාමට පැමිණීම තහනම් කර තිබුණ අවස්ථා තියෙනවා. ඒ ඔවුන්ට ලැබෙන ආදායම අඩුවුණු නිසයි. වැඩි බදු තිබුණේ මුස්ලිම්වරුන්ට නම් ස්ලාමය වෙත පැමිණෙන තරමට හොඳයි.

ඉස්ලාමීය පාලනයක් තුළ සිටින මුස්ලිම් නොවන අයගේ අයිතීන්, දේපල, ආගමික හා සංස්කෘතික අයිතීන් මැනවින් ආරක්ෂා වන බව එහි පැවසෙනවා. නමුත් මේක පූර්ණ සත්‍යයක් නෙවෙයි.

හොඳම නිදසුන වෙන්නේ එහි ම සඳහන් කර තිබෙන ජෙරුසලම්වරුත් සමග අත්සන් කරපු උමර්ගේ ගිවිසුම. එහි ක්‍රිස්තියානි අයගේ සිද්ධස්ථාන, ජීවිත, දේපල ආරක්ෂා වන බව පැවසුවත් මෙවැනි සීමාකිරීම් තිබුණා.

- Obligation to show deference toward Muslims. If a Muslim wishes to sit, non-Muslim should be rise from his seats and let the Muslim sit.
- Palm Sunday and Easter parades were banned.
- Prohibition against hanging a cross on the Churches.
- Muslims should be allowed to enter Churches (for shelter) in any time, both in day and night.
- Obliging the call of prayer by a bell or a kind of Gong (Nakos) to be low in volume.
- Prohibition against rebuilding destroyed churches, by day or night, in their own neighborhoods or those situated in the quarters of the Muslims.
- The worship places of non-Muslims must be lower in elevation than the lowest mosque in town.
- The houses of non-Muslims must not be taller in elevation than the houses of Muslims.
- Prohibition against building new churches, places of worship, monasteries, monks or a new cell. (Hence it was also forbidden to build new synagogues, although it is known that new synagogues were built after the occupation of the Islam, for example in Jerusalem and Ramle. The law that prohibits to build new synagogues was not new for the Jews, it was applied also during the Byzantines. It was new for the Christians.)
- Prohibition against preaching to Muslims in an attempt to convert them from Islam.
- Prohibition against preventing the conversion to Islam of some one who wants to convert. (ඉස්ලාම් ආගමට අනිත් අය හරවගන්න පුලුවන්, අනිත් අයට තමන්ගේ ආගමට මුස්ලිම් අය හරවගන්න බැහැ)
- Christians were forbidden to show their religion in public, or to be seen with Christian books or symbols in public, on the roads or in the markets of the Muslims.

- Prohibition of Christians and Jews against raising their voices at prayer times.
- Funerals should be conducted quietly.
- Non-Muslims must host a Muslim passerby for at least 3 days and feed him.
- prohibition against riding with a saddle.

මේවා ඇමරිකාවේ කලුජාතිකයන්ට එරෙහිව තිබුණු Apartheid නීතිවලින් වෙනස් වෙන්නෙ කොහොමද කියා මදක් හිතා බලන්න. (Apartheid නීති තව අහිංසකයි මේ එක්ක බැලුවාම) ලංකාවේ මුස්ලිම්වරුන්ට අපි අපේ සංස්කෘතික තත්ව මත ආගමික සීමාකිරීම් පැනෙවුවොත් ඔබ එය කිසිසේත් නොඉවසන බව මට විශ්වාසයි. ඉතින් අනිත් අයටත් තමන්ට වගේමයි කියා හිතන්න. එදා කිතුනුවන්ට දැනුණු අසරණ හැඟීම සිතින් මවාගන්නට හැකිවේවා කියා පතනවා.

ඒ වගෙම අදටත් ඉස්ලාම් නීතිය තුළ මුස්ලිම්වරයෙකුගේ ඝාතනයක් වෙනුවෙන් ඝාතකයාගේ මරණය වෙනුවට දෙන වන්දි මුදලට අඩු මුදලක් තමයි මුස්ලිම් නොවන අයකුට ඒ වෙනුවෙන් ලැබෙන්නේ. මෙය හරියට මුස්ලිම්වරයාගේ ජීවිතයට වඩා මුස්ලිම් නොවන්නාගේ ජීවිතය වටිනාකමින් අඩු ය කීමක් වගෙයි.

> In classical jurisprudence monetary compensation for bodily harm (*diya* or blood money) is assessed differently for different classes of victims. *Diya* for the death of a free Muslim man is twice as high as for Jewish and Christian victims according to the Maliki and Hanbali madhhabs and three times as high according to Shafi'i rules.[121] Several legals schools assessed *diya* for Magians (*majus*) at one-fifteenth the value of a free Muslim male.[121]According to Human Rights Watch and the US State Department, in Saudi Arabia Jewish or Christian male plaintiffs are entitled to half the amount a Muslim male would receive, while for all other non-Muslim males the proportion is one-sixteenth.[125][126][127]

ඒ වගේම ෂරියා උසාවියක සාක්ෂිකරුවන් ලෙසත් මුස්ලිම් නොවන අය කැඳවගන්නේ නැහැ. ඔවුන්ගේ සාක්ෂියට වටිනාමක් ලැබෙන්නේ නැහැ.

> Witnesses, in a sharia court system, must be faithful, that is Muslim.[100] Male Muslim witnesses are deemed more reliable than female Muslim witnesses, and non-Muslim witnesses considered unreliable and receive no priority in a sharia court.[101][102]

මෙවැනි තත්වයක් තුළ මුස්ලිම් නොවන්නකුට මුස්ලිම් පිරිසක් විසින් අසාධාරණයක් වුණොත් සහ ඒ සම්බන්ධව සාක්ෂි දෙන මුස්ලිම්වරු තමන්ගේ කෙනාට පක්ෂග්‍රාහී වුණොත් මුස්ලිම් නොවන්නාට දෙවියන්ගේම පිහිටයි! අවංකබව රදාපවතින්නේ පුද්ගලයාගේ ගතිගුණ මත මිසක් අදහන ආගම හෝ ජාතිය මත නෙවෙයි.

## මුස්ලිම් ආක්‍රමණ හා අන්‍යාගම් විනාශ කළ ඉතිහාසයක් ඇත.

කිසිම මුස්ලිම් පාලකයෙක් අන්‍යාගමිකයන් මැරුවේ/සිද්ධස්ථානවලට හානි කලේ නැලු. මුස්ලිම් පාලන තුළ අන්‍යාගමික සංහාර, පූජාස්ථාන විනාශ කළා නම් අද අන්‍යාගමිකයන් ඒ ප්‍රදේශවල ඉන්නෙ කොහොම ද කියලා අහනවා. මේක හරියට පෘතුගීසි, ඉංග්‍රීසි, ලන්දේසි අය ලංකාවේ ස්වදේශිකයෝ මැරුවනං අද කොහොමද ලංකාවේ සිංහල, දෙමල මිනිස්සු ඉන්නෙ කියල ඇහුව වගේ කතාවක්. එහෙම නැත්නං කාලිංග මාඝ පන්සල් වැනසුවා නං අනුරාධපුරේ නටබුන් තීන්නේ කොහොමද ඇහුවා වගේ. යටත්විජිත පාලන

සමවල සිංහලයෝ බලෙන් කතෝලික ආගමට හරවගත්ත නං අද බෞද්ධයො ඉන්නෙ කොහොමද ඇහුව වගේ.
බහාඋල්ලා තුමාට තමන්ගේ ජීවිතයම හිරගතවෙලා ගතකරන්න වුණේ ඇයි? එතුමන් ව හිරගත කළේ කවුද?

සරතුස්ත්‍රාවරුන් කියන්නෙ පර්සියාවේ ඉස්ලාමයට පෙර පැතිරිලා තිබුණු දහමක්. ඔවුන් ගේ මව්බස අදටත් ඉරානයේ තියෙන පාසි බස. නමුත් ඔවුන් අද දැකගන්න පුලුවන් වෙන්නේ ඉන්දියාව ඇතුලු රටවල. ඔවුන් ඉන්දියාවට ආවේ අරාබියේ ඉස්ලාමය බලවත් වීමත් සමග ඔවුන්ට මුස්ලිම්වරුන්ගෙන් ගැහැට විඳින්න වුණු නිසයි. නැතුව හොඳට සැලකුවා නම් ඔවුන්ට ඔලුවේ අමාරුවක් නැහැ එහෙම යන්න.

ඒ වගේම ප්‍රසිද්ධ බෞද්ධ විශ්වවිද්‍යාලයක් වුණු නාලන්දාව එහි භික්ෂූන් ව ඝාතනය කර ගිනිතැබුවේ කවුද? පුස්තකාලේ කුරානය නොතිබ්බ කියල භක්තියාර් බල්ජි නාලන්දාව ගිනිතිව්වාම එය මාස තුනක් ඇවිලුණ බව කියන්නෙ අපි නෙවි. ඔවුන්ගෙම වාර්තා. පොත් මිලියන 9 ක් පමණ එහිදී ගිනිඅරගත්ත බව කියවෙනවා. සෝම්නාත් දේවාලය කොල්ල කෑවේ කවුද?

ඔබේ සැක යන්න මුස්ලිම් කවියෙක්ම ඔවුන්ගේ කෝටාන් ආක්‍රමණය ගැන ලියපු කවියක් තියෙනවා. බලන්න කොච්චර ලස්සනද කියලා....

In 1006, the Muslim Kara-Khanid ruler Yusuf Kadir (Qadir) Khan of Kashgar conquered Khotan, ending Khotan's existence as an independent state. The war was described as a Muslim Jihad (holy war) by the Japanese Professor Takao Moriyasu. The Karakhanid Turkic Muslim writer Mahmud al-Kashgari recorded a short Turkic language poem about the conquest:

English translation:

> We came down on them like a flood,
> We went out among their cities,
> We tore down the idol-temples,
> We shat on the Buddha's head!
> [56][57][59][60][*verification needed*][61][62]

In Turkic:

> *kälginläyü aqtïmïz*
> *kändlär üzä čïqtïmïz*
> *furxan ävin yïqtïmïz*
> *burxan üzä sïčtïmïz*
> [63]

Idols of "infidels" were subjected to desecration by being defecated upon by Muslims when the "infidel" country was conquered by the Muslims, according to Muslim tradition.[63]

නාලන්දා විශ්වවිද්‍යාලය සහ සෝම්නාත් දේවාලය ගැන Muslim conquests of the Indian subcontinent විකිපීඩියා පිටුවේ මෙලෙස දැක්වෙනවා.

> In 1193, the Nalanda University complex was destroyed by Afghan Khalji-Ghilzai Muslims under Bakhtiyar Khalji; this event is seen as the final milestone in the decline of Buddhism in India. He also burned Nalanda's major Buddhist library and Vikramshila University,[118] as well as numerous Buddhist monasteries in India. When the Tibetan translator, Chag Lotsawa Dharmasvamin (Chag Lo-tsa-ba, 1197–1264), visited northern India in 1235, Nalanda was damaged, looted, and largely deserted, but still standing and functioning with seventy students.
>
> Around 1024 CE, during the reign of Bhima I, Mahmud of Ghazni raided Gujarat, and plundered the Somnath temple. According to an 1169 CE inscription, Bhima rebuilt the temple. This inscription does not mention any destruction caused by Mahmud, and states that the temple had "decayed due to time".[119] In 1299, Alauddin Khalji's army under the leadership of Ulugh Khan defeated Karandev II of the Vaghela dynasty, and sacked the

> Somnath temple.[119] The temple was rebuilt by Mahipala Deva, the Chudasama king of Saurashtra in 1308. It was repeatedly attacked in the later centuries, including by the Mughal emperor Aurangzeb.[120] In 1665, the temple, was once again ordered to be destroyed by Mughal emperor Aurangzeb.[121] In 1702, he ordered that if Hindus had revived worship there, it should be demolished completely.[122] (කිසිම මුස්ලිම් පාලකයෙක් අන්‍යාගමිකයන් මැරුවේ/සිද්ධස්ථානවලට හානි කලේ නැලු ඉතිං! නොදැනුවත්කම ද කපටිකම ද කියලයි මට හිතාගන්න බැරි)

කොන්ස්තන්තිනෝපලය ආක්‍රමණය කර ජයගත් දෙවන මොහොමඩ් සොෆියා දෙව්මැදුර මස්ජිදයක් බවට හැරවූ බවත් රහසක් නොවෙයි.

